# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2016

## Primary Piriven Mid Year Term Test - 2016

2 වසර / Grade 2


සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

ගණිතය
Mathematics

කාලය : පැය දෙකයි
Time : Two hours

### I කොටස

**ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.** ( ලකුණු $2 \times 20 = 40$ යි )

| | |
|---|---|
| 01. $(+9) + (-4)$ සුළු කරන්න. | 02. $1275\,m$ කිලෝමීටරවලින් දක්වන්න. |
| 03. 8 හා 12 හි මහා පොදු සාධකය කීය ද? | 04. නිෂ්පාදන වියදම රුපියල් 750 ක් වූ පාසල් බෑගයක් රුපියල් 1000 කට විකිණීමෙන් ලැබෙන ලාභ මුදල කොපමණ ද? |
| 05. $20^0$ හි අනුපූරකය කීය ද? | 06. $\frac{1}{8}$ ඒවා 3 ක් කොපමණ ද? |
| 07. $P^7 \div P^4$ සුළු කරන්න. | 08. 0.4 ප්‍රතිශතයක් ලෙස දක්වන්න. |
| 09. කාණුවක් කැපීමට මිනිසුන් 05 දෙනෙකුට දින 03 ක් ගතවේ නම්, සිදු කරන වැඩ ප්‍රමාණය මිනිස් දින කොපමණ ද? | 10.   $y$ හි විශාලත්වය කොපමණ ද? |
| 11. $3P - 12$ හි සාධක සොයන්න. | 12. $x = 2$ නම් $x^2 + 1$ හි අගය සොයන්න. |
| 13. පේර ගෙඩි 05 ක මිල රුපියල් 60 ක් නම්, එවැනි පේර ගෙඩි 2ක මිල සොයන්න. | 14. $\sqrt{144}$ හි අගය සොයන්න. |
| 15. $(-4a) \times (-2b)$ සුළු කරන්න. | 16. $y = -3x$ මගින් දැක්වෙන ප්‍රස්තාරයේ අනුක්‍රමණය කුමක් ද? |
| 17. ඇමෙරිකානු ඩොලරයක වටිනාකම ශ්‍රී ලංකා රුපියල් 150 ක් නම්, ශ්‍රී ලංකා රුපියල් 7500 ක් දුන් විට ඇමෙරිකානු ඩොලර් කීයක් ලැබේ ද? | 18. $2, 1, 4,\ a,\ 2, 6, 4$ හි මාතය 2 නම් $a$ හි අගය සොයන්න. |

| | |
|---|---|
| 19. කෝණමානය භාවිතයෙන් $70^0$ ක කෝණයක් ඇඳ එය $K\hat{L}M$ ලෙස නම් කරන්න. | 20. ඍජුකෝණී ත්‍රිකෝණයක් ඇඳ එහි ශිර්ෂ $A, B, C$ ලෙස නම් කරන්න. |

## II කොටස

ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න. ( එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලැබේ. )

**1.** පහත දැක්වෙන්නේ වෙළඳසැලක ප්‍රදර්ශනය කර තිබූ මිල දර්ශණයක කොටසකි.

| ද්‍රව්‍ය | ප්‍රමාණය | මිල (රුපියල්) |
|---|---|---|
| හාල් | 1 kg | 90.00 |
| පරිප්පු | 1 kg | 120.00 |
| පිටි | 1 kg | 110.00 |
| රතු ළූණු | 1 kg | 160.00 |
| අමු මිරිස් | 500 g | 450.00 |

I. හාල් 5 kg ක මිල කොපමණ ද ?

II. පිටි 10 kg ක් හා පරිප්පු 5 kg ක් මිලදී ගැනීමට වැයවන මුදල සොයන්න.

III. අමු මිරිස් 1 kg ක් මිලදී ගෙන වෙළෙන්දාට රුපියල් 1000 ක් දුන් විට, ලැබෙන ඉතුරු මුදල සොයන්න.

IV. රතු ළූණු $2\frac{1}{2}\ kg$ ක් මිලට ගත් කමලා රුපියල් 500 ක නෝට්ටුවකින් එම මුදල ගෙවන ලදි. ඇයට ඉතුරු ලෙස ලැබුණු මුදලින් පරිප්පු 1 kg ක් මිලට ගත හැකි ද? පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

**2.**

I. $\frac{x^5 \times y^4 \times x^4}{x^2 \times y^2 \times y}$ සුළු කරන්න.

II. $(x+3)(x-2)$ වරහන් ඉවත් කර සුළු කරන්න.

III. m = 2 ද n = (-3) ද නම්
$n^2 - nm - 1$ හි අගය සොයන්න.

**3.**

I. $y = \frac{1}{2}x$ සරල රේඛීය ප්‍රස්තාරය ඇඳීම සඳහා පහත දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

| $x$ | 0 | 2 | 4 | 6 | 8 |
|---|---|---|---|---|---|
| $y$ | 0 | …….. | 2 | …….. | 4 |

II. $x$ හා $y$ හි අගයන් පටිපාටිගත යුගල ලෙස ලියා දක්වන්න.

III. සුදුසු ඛණ්ඩාංක තලයක $y = \frac{1}{2}x$ හි ප්‍රස්තාරය අඳින්න.

IV. එම ප්‍රස්තාරයේ අනුක්‍රමණය සොයන්න.


**4.**

I. $\frac{2}{3}+\frac{1}{2}-\frac{1}{6}$ සුළු කරන්න.

II. $\left(\frac{2}{5}+1\frac{1}{4}\right)\div 2\frac{1}{5}$ සුළු කරන්න.

III. $\frac{1.2}{0.24}$ හි අගය සොයන්න.

**5.** දක්වා ඇති රූපයේ,




I. පරිමිතිය සොයන්න.

II. ඍජුකෝණාස්‍රාකාර කොටසේ වර්ගඵලය සෙයන්න.

III. එක් ඍජුකෝණී ත්‍රිකෝණ කොටසක වර්ගඵලය සොයන්න.

IV. දක්වා ඇති මුළු රූපයේ වර්ගඵලය සොයන්න.

**6.**

a. යුරෝ එකක වටිනාකම ශ්‍රී ලංකා රුපියල් 270 ක් වන අවස්ථාවක ඉතාලියේ දී මිලට ගත් යුරෝ 5 ක් වටිනා බිත්ති සැරසිල්ලක වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණ ද?

b. රඹුටන් ගෙඩියක් රුපියල් 4 බැගින් ගෙඩි 100 ක් මිලට ගත් අයෙකු එම රඹුටන් ගෙඩි 100 ගෙඩි 4 බැගින් වූ ගොඩවල් සාදා එක් ගොඩක් රුපියල් 20 බැගින් විකුණයි.

I. රඹුටන් ගැනීමට වැය වූ මුළු මුදල කොපමණ ද?

II. වෙළෙන්දාට ගෙඩි 4 බැගින් වන සේ සෑදිය හැකි රඹුටන් ගොඩවල් ගණන කීය ද?

III. රඹුටන් ගොඩවල් සියල්ල ම අලෙවි කළේ නම් වෙළෙන්දාට ලැබෙන මුළු මුදල කොපමණද?

IV. වෙළඳාමෙන් ඔහුට සිදුවූ ලාභය හෝ අලාභය කොපමණ ද?

**7.** ක්‍රිකට් ක්‍රීඩකයකු සහභාගි වූ තරග 05 දී රැස් කළ ලකුණු ප්‍රමාණ පහත දැක්වේ.

43 , 74 , 28 , 52 , 53


I. ක්‍රීඩකයා මෙම තරග 05 සඳහා ලැබූ ලකුණුවල මධ්‍යනය ලකුණ කුමක් ද?

II. මෙම ක්‍රීඩකයා එම තරගවලින් පසුව තවත් තරග 03 කට සහභාගි වී, එම තරග 03 සඳහා ලැබූ ලකුණුවල මධ්‍යනය 26 ක් වන බව පවසයි නම්, එම තරග තුනේදී ඔහු විසින් රැස් කළ මුළු ලකුණු ප්‍රමාණය කොපමණද?

III. ක්‍රීඩකයා විසින් සහභාගි වූ තරග 08 දීම රැස් කළ මුළු ලකුණු ප්‍රමාණය සොයා ඒ ඇසුරින් තරග 08 සඳහා ම ඔහුගේ මධ්‍යනය ලකුණ ගණනය කරන්න.


**8.**

I.





$x$ හි අගය සොයන්න.

II.




$a, b$ හි අගයන් සොයන්න.

III.




$p, q$ හි අගයන් සොයන්න.

The National e-learning Portal for The General Education

* * *